**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2015**

**------------------------------------------**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන **1996** පෙබරවාරි 09 දිනැති අංක 909/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 1996 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 21 වගන්තිය සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **107(5)** උප වගන්තිය, සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ **108(1)** උප වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 - 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා **1978** අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

උපචිත පදනමට ආදායම් හඳුනාගත යුතු වුවත්, 2015 වර්ෂය සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමේදී පාඨමාලාවලට අදාළ පාඨමාලා ගාස්තුව වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා රු.1,795,650 කින් සමාලෝචිත වර්ෂයේ ආදායම් අඩුවෙන් දැක්වුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම් රු.337,750 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබූ බැවින් හා සමාලෝචිත වර්ෂයේ බාහිර දේශන ගාස්තු වෙන් කිරීම් රු.**5,111,375** ක් වුවත් එය රු.2,020,320 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ප්‍රවාහයක් නොවන ගනුදෙනු යටතේ ගැලපීම් කර තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තුල්‍යතාවය පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

ඉකුත් වර්ෂයේදී පවත්වන ලද කෙටිකාලීන පාඨමාලා හා වැඩමුළුවලට ආහාර සැපයීම වෙනුවෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.903,030 ක් සහ ආසියානු ආපදා සූදානම් මධ්‍යස්ථානය **(Asian Disaster Preparness Centre)** ව්‍යාපෘතියට අදාළව 2012, 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.855,470 ක සම්බන්ධීකරණ දීමනා වියදම් අතීතානුයෝගීව ගැලපීම් කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසානයට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු විදුලි ගාස්තු හා ගොඩනැගිලි කුලිය රු. 179,893 ක් හා විදේශ සැපයුම් වෙනුවෙන් විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු රු.72,999 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.**3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. **29,430,750** ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 2013 වර්ෂයේදී ආපදා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (**Master of Science in Disaster Management**) හදාරන ලද ශිෂ්‍යයින් 14 දෙනෙකු වෙනුවෙන් ලබා දෙන ලද ශිෂ්‍යත්ව මුදල | 875,000 | ශිෂ්‍යත්ව මුදල් ලබාගත් බවට ලිඛිත සනාථ කිරීම් |
| (ආ) | පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ලද රසායනික ද්‍රව්‍ය හා පර්යේෂණ උපකරණ | 10,453,888 | තොග පොත් |
| (ඇ) | 2010 - 2015 කාලය තුළ නිම කළ පර්යේෂණයන් | **18,101,862** | අදාළ ක්ෂේත්‍රයන්හි අභිවෘද්ධිය පිණිස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයන් |
| | | **29,430,750** | |

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලයට අදාලව ශිෂ්‍යයන් වෙත ආපසු ගෙවිය යුතු පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු රු. 2,448,050 ක් නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස ආයතන අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂවලට අදාළව අධ්‍යයන මණ්ඩල (**Board of Studies**) 06 ක් සඳහා ගෙවිය යුතු රු.**755,122** ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය | |
| | **(i)** 10(6) වගන්තිය | කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් වෙත දීමනා ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.**204,100** ක් ගෙවීම් කර තිබුණි. |
| | **(ii)** 11.2**(ඖ)** හා (ඓ) වගන්ති | ආයතනයේ කටයුතු පවත්වාගෙන යෑම සඳහා අතුරු නීති නියමාවලියන් සකස්කරගත යුතු වුවත්, 2016 මාර්තු 15 දින දක්වාම එම අතුරු නීති නියමාවලි සකස් කර නොතිබුණි. |
| | **(iii)** 17(2) වගන්තිය | ආයතනය වෙත ලැබෙන සියලුම මුදල් ආයතනයේ අරමුදලට බැර කිරීම සම්බන්ධයෙන් වූ මාසික වාර්තා ඊළඟ මාසය අවසන් වීමට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එසේ කර නොතිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ **VI** පරිච්ඡේදයේ 47 වගන්තිය හා 2011 අප්‍රේල් 28 දිනැති අංක 955 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 02 වගන්තිය | සේවක අර්ථසාධක අරමුදල් දායකය, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය හා පාරිතෝෂිකය ගණනයට අධ්‍යයන දීමනා අදාළ කර නොගත යුතු වුවත්, අධ්‍යයන දීමනා ඇතුළත් කර ගණනය කිරීම හේතුවෙන් ඉහත අරමුදල් සඳහා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් එකතුව රු.365,924 ක දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ **II** කොටසේ **VIII** පරිච්ඡේදයේ 6.2 හි **(ii)** හා **(iii)** වගන්ති | තම රාජකාරියට අමතරව වෙනත් සේවාවකින් උපයාගන්නා ගාස්තුවලින් සියයට 10 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වුවද, ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද |

| | | |
|---|---|---|
| | | රු.8,688,860 ක බාහිර දේශන ගාස්තුවලින් රු.868,886 ක්ද, රු.1,704,740 ක සම්බන්ධීකරණ ගාස්තුවලින් රු.170,474 ක්ද ගාස්තුව ගෙවන අවස්ථාවේදී අවකරණය කරගෙන විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපතිගේ චක්‍රලේඛ ලිපිය | සංග්‍රහ දීමනා ලබා ගැනීමට හිමිකමක් නොමැති ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු වෙත 2014 ජූලි සිට 2015 දෙසැම්බර් දක්වා සංග්‍රහ දීමනා ලෙස එකතුව රු.146,706 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන් විසින් පර්යේෂණ යෝජනාවේ ප්‍රගතිය පිළිබඳ වාර්තා, පර්යේෂණ කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර නොතිබියදී සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 04 දෙනෙකු වෙත එකතුව රු. 902,497 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. |

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විවිධ පර්යේෂණ ව්‍යාපෘති **09** ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.2,172,246 ක පර්යේෂණ වියදම් දරා තිබුණි.

(ආ) 2015 ජනවාරි 22 දිනැති අංක 01/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපතිගේ චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව පශ්චාත් උපාධි පාඨමාලා පැයක් සඳහා ගෙවනු ලබන බාහිර දේශන ගාස්තු හා ප්‍රායෝගික පරීක්ෂණ පැයක් සඳහා රු.1,000 ක අවමයකට යටත්ව විශ්වවිද්‍යාල පාලන අධිකාරිය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයන් මත ගෙවීම් කළ යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය තුළ පැයක් සඳහා රු. 1,500 සිට රු.3,500 දක්වා වූ වටිනාකම් පරාසය තුළ ගෙවීම් කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**26,173,802** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,181,712 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,992,090 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විනිමය ලාභය රු. 8,436,092 ක්

වැඩිවීම හා රජයේ පුනරාවර්තන ප්‍රදාන රු. 2,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබූ අතර, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු.41,238,652 ක් වූ ආයතනයේ දායකත්වය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී  රු. 81,852,722 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

4.1 කාර්යසාධනය
-----------------

1996 අංක 01 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව ආයතනයේ මූලික පරමාර්ථ පහතින් දැක්වේ.

- පශ්චාත් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ඨ ආයතනයක් කිරීම.
- මූලික හා සංයුක්ත විද්‍යාත්මක පරීක්ෂණ සඳහා විශිෂ්ඨ ආයතනයක් බිහි කිරීම.
- සමාජයට විද්‍යාත්මක තොරතුරු ව්‍යාප්ත කිරීම.
- ඉහළ මූල්‍ය හා පරිපාලනමය කාර්යක්ෂමතාවයකින් හෙබි විශිෂ්ඨම පශ්චාත් උපාධි ආයතනයක් බිහි කිරීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විද්‍යා පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් 2016 මාර්තු 15 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කර තිබූ සිසුන් සංඛ්‍යාව එක් එක් වර්ෂවල ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාවෙන් සියයට 53 ත් සියයට 76 ත් අතර විය.

(ආ) දර්ශනපති හා දර්ශනශූරී උපාධිය සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී හා 2015 වර්ෂයේදී පිළිවෙලින් සියයට 16 ක හා සියයට 33 ක් ලෙස අඩු වී තිබූ අතර, ඒ සම්බන්ධව ආයතනය විසින් හේතු සොයා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.2 අරමුදල් උපයෝජනය
------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය මුළුමනින්ම තම ඉපයීම් මත යැපෙන මට්ටමට වර්ධනය කරගත යුතු බව විශ්වවිද්‍යාල  ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනය සතුව එකතුව රු.303,164,460 ක් ස්ථාවර තැන්පතු හා මුදල් ශේෂයක් පැවතියද භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.22,000,000 ක් ලබාගෙන තිබුණි.

(ආ) පර්යේෂණ 06 කට අදාළව එකතුව රු. **1,761,912** ක මුදල වර්ෂ 02 ක සිට වර්ෂ 07 දක්වා කාලයක් පර්යේෂණ සඳහා උපයෝජනය නොකර පර්යේෂණ අරමුදලේ රඳවාගෙන තිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

ආයතනයේ කාර්ය මණ්ඩලයේ තනතුරු 11 ක පුරප්පාඩු 14 ක්  පැවති අතර**,** ස්ථිර මහාචාර්යවරුන් හා බාහිර මහාචාර්යවරුන් 04 දෙනෙකු, පර්යේෂණ සහකාරවරයෙකු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ

10 දෙනෙකුගේ පුරප්පාඩු ඇතුළත් වීමෙන් ආයතනයේ අධ්‍යයන හා ආයතනික කටයුතු ප්‍රශස්ථ අයුරින් ඉටුකර ගැනීමට එය බාධාවක්ව පැවතුණි.

4.4 වෙළඳපොල කොටස

------------------------

ශිෂ්‍ය අධ්‍යයනය සඳහා ආයතනික පිළිගැනීම, ආයතනයෙන් බිහිවන උපාධිධාරීන්ට ඇති ඉල්ලුම, එක් ශිෂ්‍යයෙකුට ආයතනයේ සේවක සංඛ්‍යා අනුපාතය, ආයතනයට අදාළ පර්යේෂණ යොදා ගැනීම, ජාත්‍යන්තර පීඨ හා ජාත්‍යන්තර ශිෂ්‍ය අනුපාතය යන නිර්ණායක පදනම් කරගෙන **Quacquarelli Symonds** ආයතනය විසින් සැකසූ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2014 / 2015 වර්ෂයේ 15352 වෙනි ස්ථානයේ පැවති නමුත්, 2015 / 2016 වර්ෂයේදී 16152 දක්වා ස්ථාන 800 කින් පහළ බැස තිබුණි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ස්ථාන අතරින් 2014 / 2015 වර්ෂයේදී 25 වන ස්ථානය ලබා තිබූ නමුත් 2015 / 2016 වර්ෂයේදී එය 26 ස්ථානය දක්වා එක් ස්ථානයකින් පහළ බැස තිබුණි. ඒ අනුව තම ශ්‍රේණිගත ස්ථානය පවත්වාගෙන යාමට ආයතනය අපොහොසත් වී තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/**2009(1)** දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන ඒකකය විසින් තම ආයතනය වෙනුවෙන් මූලික වාර්තාව, කාර්තුමය වාර්තා හා අදාළ වර්ෂයේ සාරාංශ වාර්තාව ඉලක්ක දිනයන්වලදී කළමනාකරණ විගණන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2 විගණන කමිටු

-----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව විසින් තම නිරීක්ෂණ, නිර්දේශ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම විගණන කමිටුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික විගණන සැලැස්ම, අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ කමිටු වාර්තා ඉදිරිපත් කිරීම යනාදි කරුණු ඉටු කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

5.3 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 30 ක සියයට 28 සිට සියයට 87 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර<br>------------------------------ | නිරීක්ෂණ<br>----------- |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම |
| (ආ) | අරමුදල් පාලනය | මුදල් පනතේ විධිවිධානවලට පටහැනි ලෙස අරමුදල් ආයෝජනය කිරීම |
| (ඇ) | පර්යේෂණ හා ප්‍රදාන | පර්යේෂණ ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම |
| (ඈ) | තොග හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පාලනය | භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම |
| (ඉ) | ජ'නල් වවුචර් | ජ'නල් වවුචර් සහතික නොකිරීම |